චක්‍රලේඛ අංක - 72.

අපේ අංකය : සං/ප්‍රති/01
වගා සහනාධාර චක්‍රලේඛ අංක 72
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
අංක 70, පාර්ලිමේන්තු පාර
පැලවත්ත, බත්තරමුල්ල.
2012.11. 29

සියළුම ප්‍රාදේශීය කළමණාකරුවන් වෙත.

**2013 වසරේදී කුඩා තේවතු සංවර්ධන සමිති මගින් අමතර**
**<u>හෙක් : 400 ක් තේ නැවත වගාවට යොමුකිරීම.</u>**

අරමුණ :

- කුඩා තේ වතු සංවර්ධන සමිති මගින් හෙක්ටයාර් 400 ක් 2013 වසරේදී නැවත වගාවට යොමුකිරිම.
- ඒ තුලින් 2% ක නැවත වගා ඉලක්කයක් ලගාකර ගැනීම සඳහා සමිති සහභාගිත්වය ලබා ගැනීම.
- කුඩා තේ වතු සංවර්ධන සමිතිවල සාමාජිකත්වය සජිවීකරනය සඳහා ක්‍රියාවලියක් ස්ථාපිත වීම.

ක්‍රියාත්මක ක්‍රමවේදය :

1. කුඩා තේ වතු සංවර්ධන සමිති මගින් එම වර්ෂය තුලදී තම බලප්‍රදේශය තුල නැවත වගා කිරිම සඳහා විභව ප්‍රදේශයක පිහිටි කුඩා තේ වතු හිමියන් පිරිසකගෙන් අයදුම්පත්‍ර භාරගැනීමට කටයුතු කළ යුතු අතර, හැකිතාක් දුරට එම ප්‍රදේශයේ තේ නැවත වගා කටයුතු සමිති මගින්ම ඉටු කිරිම සිදුකළ යුතුය.

2. සමිති පාදකව ක්‍රියාත්මක කරන නැවත වගා ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කෙරෙන ඉල්ලුම්පත්‍ර විශේෂිත මුද්‍රණයක් ලෙස කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානය වෙත සහනාධාර මුදලින් අයකර ගැනීමේ පදනම මත නිකුත් කරනු ලැබේ.

3. මෙම තෝරා ගැනීම වගා කටයුතු සැපයුම් හා පරීක්ෂණ කටයුතු සාමුහිකව ඉටුකිරිම පහසු කෙරෙන ආකාරයට සිදුකිරිම කෙරෙහි අවධානය යොමු වියයුතුය.

4. ප්‍රදේශයේ කුඩා තේ වතු සංවර්ධන සමිතිය නම් කරන සමිති නිලධාරියෙකු / කමිටු නියෝජිතයකු හෝ වෙනත් අයෙකු මෙම ක්‍රියාවලියේදී සම්බන්ධිකාරකවරයෙකු වශයෙන් කටයුතු කළ යුතු අතර, ඔහු/ඇය කවරෙක්ද යන්න අධිකාරිය වෙත දැනුම් දිය යුතුය.

5. සමිති විසින් තෝරා ගන්නා ලද කුඩා තේවතු හිමියන් සමග සංවිධානාත්මකව ප්‍රදේශයේ තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීගේ සහභාගිත්වයෙන් ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කිරීම සිදුකල යුතු අතර බැංකු ගිණුම් පිළිබඳව තොරතුරු නිවැරදිව සදහන් කිරීමට අවධානය යොමුකල යුතුය.

6. සමිතිය විසින් ලබාගන්නා අයදුම්පත්‍රවල සමිතියෙහි මුද්‍රාව තබා ඉඩම් අයිතිය සනාථ කෙරෙන හිමිකම් ප්‍රකාශය සහතික කිරීමද, කුඩා තේ වතු සංවර්ධන සමිතිය විසින් ඉටුකර, සමිතියේ සම්බන්ධිකරණ නිලධාරි විසින් කරන ලද පෙර පරීක්ෂණයකින් අනතුරුව මෙම අයදුම්පත්‍ර ලේඛනගත කර ප්‍රදේශයේ තේ පරීක්ෂක /ව්‍යාප්ති නිලධාරී වෙත ඇමුණුම 01 මගින් භාරදිය යුතුවේ. එහි පිටපතක් ප්‍රාදේශීය කළමණාකරු වෙත ඉදිරිපත් කළයුතුය.

7. ප්‍රදේශයේ තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී විසින් අදාල සමිතියේ සම්බන්ධිකාරකගේ මැදිහත්වීම සහ සහයෝගය ලබාගෙන අයදුම්කරන ලද ඉඩම් පරීක්ෂා කර පරීක්ෂණ වාර්තාද ලේඛණගත කර ප්‍රාදේශීය කළමණාකරු වෙත ඇමුණුම 02 මගින් ඉදිරිපත් කළයුතුය.

8. නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ සමිති මගින් ඉටුකරන නැවත වගා සංවර්ධන කටයුතු වෙන් වශයෙන් හදුනා ගැනීම සහ ප්‍රගතිය නියාමනය සදහා දත්ත පද්ධතිය තුල විශේෂිත සළකුණු කිරීමක් (Flag කිරීමක්) කළ යුතුය.

9. අදාල සමිතිය වෙත නිකුත් කෙරෙන අවසරපත්‍ර උපලේඛනයක් මගින් ලබාදිය යුතු අතර එහි පිටපතක් ක්ෂේත්‍ර නිලධාරී වෙතද ඇමුණුම 03 පරිදි යොමුකල යුතුය. මෙම අවස්ථාවේදීම අදාල ඉල්ලුම්කරු වෙතද ඇමුණුම 03A පරිදි දැනුම් දියයුතුය.

10. මෙම ඉඩම්වල වගා සංවර්ධන කටයුතුවලදී කණ්ඩායමක් වශයෙන් නියමිති කාලවකවානු තුල එම කටයුතු සිදුකිරීම සදහා සමිතියේ සම්බන්ධිකාරක විසින් සාමාජිකත්වය සමග සම්බන්ධීකරණය පවත්වා ගනිමින් දිරිගැන්වීම කලයුතුය.

11. ඉන් අනතුරුව එක් එක් අදියරට අදාල කටයුතු නිම කිරීමෙන් පසු ව්‍යාප්ති නිලධාරී වෙත දැනුම්දීමෙන් පසුව මූලික පරීක්ෂණය පැවැත්වූ ආකාරයටම ඒ ඒ සමිතියේ ක්ෂේත්‍ර සංවර්ධන කටයුතුවල පරීක්ෂණ පවත්වා ඇමුණුම 02 පරිදි ප්‍රාදේශීය කාර්යාලයට වාර්තා කළයුතුය.

12. ක්ෂේත්‍ර කටයුතු සදහා අවශ්‍ය විය හැකි තෘණ, පොහොර, පැල හෝ යෙදවුම් තවාන් සදහා අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගැනීම අදාල සමිතියේ සම්බන්ධීකාරක විසින් සම්බන්ධීකරණය කිරීමෙන් නියමිත කාලවකවානුව තුල එම කටයුතු ක්ෂේත්‍රයේ සිදුවන බව තහවුරු කළයුතුය.

13. තෝරා ගන්නා ලද කණ්ඩායම නියමිත පරිදි අදාල කාලවකවානු තුලදී එම කටයුතු සම්පූර්ණ කිරීම ප්‍රදේශයේ කුඩා තේ වතු සංවර්ධන සමිතිය තම සම්බන්ධිකාරකගේ මැදිහත්වීමෙන් කාර්යක්ෂමව ඉටුකරවා ගැනීම කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් අපේක්ෂා කෙරේ.

14. මෙම නැවත වගා කටයුතුවලට අදාලව වෙන් වෙන් වශයෙන් අවසරපත්‍ර හිමියන් වෙත නිකුත් කරන සහනාධාර චෙක්පත් අදාල අය වෙත නිකුත් කිරීම සඳහා සමිතිය වෙත ඇමුණුම 04 ආකෘතිය මගින් භාරදිය යුතු අතර මෙම කාර්ය ප්‍රමුඛතා පදනමකින් ඉටුකල යුතුය.

15. මෙම නැවත වගා කණ්ඩායම්වලට අදාල වන සහනාධාර චෙක්පත් නිකුත් කිරීම අදාල සමිතිය හරහාම ක්‍රියාත්මක කලයුතු අතර, චෙක්පත් ලබාගත් බවට ලදුපත් සමිතිය මගින් ආකෘති අංක 5න් ප්‍රාදේශීය කළමණාකරු වෙත එවිය යුතුය.

අතුරු ප්‍රයෝජන :

- සමිති සම්බන්ධීකරණය තුලින් සාමුහිකත්වයෙන් වගා කටයුතු ඉටුකර ගැනීමේ පහසුව.
- නියමිත කාලය තුල වගා කටයුතු නිම කිරීමට ඇති හැකියාව තුලින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ඉලක්කයට ලගාවීම සඳහා ක්‍රමවේදයක් සැකසීම.

වෙනත් කරුණු :

i. අදාල සමිතිය විසින් තෝරා ගනු ලබන කණ්ඩායම අධිකාරියේ ප්‍රතිඵලපාදක කළමණාකරණ වැඩ සටහන යටතේ ක්‍රියාත්මක වන නැවත වගා කණ්ඩායමක් ලෙස ක්ෂේත්‍ර නිලධාරී විසින් නම්කරනු ලැබිය යුතුය.

ii. කොට්ඨාශ සංවර්ධන කමිටු රැස්වීමේදී මෙම වැඩ සටහන විශේෂ ව්‍යාපෘතියක් ලෙස සලකා විශේෂ අවධානයකින් කටයුතු කළයුතුය.

iii. උප කාර්යාල රැස්වීමේදී සහ ප්‍රාදේශීය කාර්යාල රැස්වීම්වලදී මෙම ව්‍යාපෘති කටයුත්ත පිළිබඳව ප්‍රගතිය විමර්ශනය වෙන් වෙන් වශයෙන් අවධානයට යොමු කල යුතුය.

iv. තේ පරීක්ෂක පුරප්පාඩු පවතින කොට්ඨාශවල මෙම වැඩ පිළිවෙල විශේෂ අවධානයක් යොමුකර ස්ථානභාර නිලධාරීගේ අධීක්ෂණය යටතේ ඉටුකරනු ලැබිය හැකිය.

v. සමිතිය මගින් ඉටුකරන නැවත වගා ව්‍යාපෘතිය කුඩා තේ වතු සංවර්ධන ප්‍රාදේශීය සමිති සංවිධානයේ හා සමස්ත ලංකා සංවිධානයේද අධීක්ෂණයට හා ඇගයීමට ලක්කල යුතුය.

නොවල් පද්මසිරි කාරියවසම්
සභාපති.

පිටපත් :

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සංවර්ධන /ව්‍යාප්ති)
2. සහකාර සාමාන්‍යාධිකාරි (පාලන/සේවා)
3. අභ්‍යන්තර විගණක
4. මුදල් කළමණාකරු
5. කළමණාකරු (සැලසුම් හා නියමුකරණ)
6. සියළුම මාණ්ඩලික නිලධාරින්
7. ගරු සභාපති / ගරු ලේකම් / ගරු භාණ්ඩාගාරික
   සමස්ත ලංකා සමිති සංවිධානය
8. ගරු සභාපති/ගරු ලේකම්/ගරු භාණ්ඩාගාරික
   සියළුම ප්‍රාදේශීය සංවිධාන

ඇමුණුම - 01

## කුඩා තේවතු සංවර්ධන සමිති ආශ්‍රිත නැවත වගා විශේෂ ව්‍යාපෘතිය

### තේ නැවත වගා ඉල්ලුම්පත්‍ර භාරදීම

සමිතියේ නම : ..............................................

තේ පරීක්ෂක ව්‍යාප්ති/නිලධාරී නම : ..............................................

සේවා කොට්ඨාශය : ..............................................

| අනු අංකය | නැවත වගා ඉල්ලුම්කරුගේ නම | ලිපිනය | ඉඩමේ නම | ඉල්ලුම්පත්‍රයේ අනු අංකය | පරීක්ෂණයේ තීරණය | සමිතිය නිර්දේශ කරන බිම් ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

..............................................

ගරු ලේකම්

..............................................

සමිති සම්බන්ධිකරන නිලධාරීගේ අත්සන

සමිති මුද්‍රාව

පිටපත : ප්‍රාදේශීය කළමණාකරු ..............................................

දිනය : 2013

ඇමුණුම 02

## කුඩා තේ වතු සංවර්ධන සමිති ආශ්‍රිත නැවත වගා විශේෂ ව්‍යාපෘතිය පරීක්ෂණ පත්‍රිකා යොමුකිරීම.

ප්‍රාදේශීය කළමණාකරු : ........................................................

............................................. කුඩා තේ වතු සංවර්ධන සමිතිය

| අනු අංකය | ඉල්ලුම්කරුගේ නම | අවසරපත්‍ර අංකය | නිර්දේශ කරන බිම් ප්‍රමාණය |
|---|---|---|---|
| | | | |

.............................................

තේ පරීක්ෂක ව්‍යාප්ති /නිලධාරී

පිටපත : ........................................................ කුඩා තේ වතු සංවර්ධන සමිතිය

.............................................

ඇමුණුම 03

# කුඩා තේ වතු සංවර්ධන සමිති ආශ්‍රිත නැවත වගා විශේෂ ව්‍යාපෘතිය

## සමිති වෙත දිරිදීමනා අවසරපත්‍ර යොමුකිරීම

සමිතියේ නම : ..................................................

| අනු අංකය | ඉල්ලුම්කරුගේ නම | ලිපිනය | අවසරපත්‍ර අංකය | අනුමත බිම් ප්‍රමානය |
|---|---|---|---|---|
| | | | | |

............................................

ප්‍රාදේශීය කළමණාකරු / සහකාර ප්‍රාදේශීය කළමණාකරු

පිටපත : 1. තේ පරික්ෂක ව්‍යාප්ති /නිලධාරී

....................................

ඇමුණුම 3A

......................................................... මහතා/මහත්මිය

.........................................................

.........................................................

**කුඩා තේ වතු සංවර්ධන සමිති ආශ්‍රිත නැවත වගා විශේෂ ව්‍යාපෘතිය**

**<u>තේ නැවත වගා අවසරපත්‍රය</u>**

සමිති ආශ්‍රිත තේ නැවත වගා විශේෂ ව්‍යාපෘතිය යටතේ............................... නැමැති ඉඩමේ හෙ. .................... (අක්........ රූඩ්......... පර්..........)ක බිම් ප්‍රමානයක තේ නැවත වගා කිරිම සඳහා ............................................... අංක දරණ දිරිදීමනා අවසර පත්‍රය, පස සාරවත් කිරිම (සහිතව/රහිතව) තේ වගා කිරිම සඳහා අනුමැතිය ලබාදීමට අදාල අවසර පත්‍රය ඔබ කුඩා තේ වතු සංවර්ධන සමිතිය වෙත යවා ඇති බව කාරුණිකව දන්වමි.

.................................................

ප්‍රාදේශීය කළමණාකරු/සහකාර ප්‍රාදේශීය කළමණාකරු

ඇමුණුම 04

## කුඩා තේ වතු සංවර්ධන සමිති ආශ්‍රිත නැවත වගා විශේෂ ව්‍යාපෘතිය

## <u>සමිතිය වෙත චෙක්පත් භාරදීම</u>

.................................................. කුඩා තේ වතු සංවර්ධන සමිතිය

..................................................

| අනු අංකය | වගාකරුගේ නම | දිරිදීමනා අවසරපත්‍ර අංකය | චෙක්පත් අංකය | මුදල |
|---|---|---|---|---|
| | | | | |

මේ සමග එවා ඇති චෙක්පත් ඉහත සදහන් අවසරපත්‍ර ලාභීන් වෙත බෙදාදී ඇමුණුම 05 ලේඛනය මාවෙත එවීමට කටයුතු කරන්න.

....................................

ගණකාධිකාරී

පිටපත : තේ පරීක්ෂක ව්‍යාප්ති /නිලධාරී

.......................................

ඇමුණුම 05

## කුඩා තේ වතු සංවර්ධන සමිති ආශ්‍රිත නැවත වගා විශේෂ ව්‍යාපෘතිය

## <u>චෙක්පත් වගාකරුවන් වෙත භාරදුන් බවට සහතික කිරීම</u>

ප්‍රාදේශීය කළමණාකරු

.......................................

| අනු අංකය | වගාකරුගේ නම | දිරිදීමනා අවසරපත්‍ර අංකය | චෙක්පත් අංකය | භාරගත් බවට අත්සන |
|---|---|---|---|---|
| | | | | |

ඉහත අංක සදහන් චෙක්පත් නියමිත අවසරපත්‍ර ලාභීන් වෙත භාරදුන් බවට සහතික කරමි.

.......................................

සමිති නිලධාරී අත්සන